# උත්ථාන සමයේ දෙවන සතිය
# බ්‍රහස්පතින්දා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතෙන් ගත් පාඨයෙකි. ක්‍රියා **5 : 27 – 33**

**මේ ගැන ශුද්ධාත්මයාණන් ද අප ද සාක්ෂි දරමු.**

දේව මාලිගාවේ සේනාධිපතියා සිය මුර සේවකයන් සමග අපෝස්තුළුවරුන් ගෙනවුත් මන්ත්‍රණ සභාව ඉදිරියෙහි සිටෙව්වෝය. උත්තම පූජකයා ඔවුන් අමතා "මේ මිනිසාගේ නාමයෙන් නුගන්වන ලෙස අපි ඔබට අණ කළෙමු. එහෙත් ඔබ ඔබගේ මේ ධර්මය ජෙරුසලම පුරා පතළ කර මේ මිනිසාගේ මරණය ගැන අප වගකිව යුත්තන් කරන්නට අදහස් කරන්නාහු දැ" යි ඇසූහ. එවිට පේදුරු සහ අපෝස්තුළුවරු පිළිතුරු දෙමින් "අප මිනිසුන්ට නොව දෙවියන් වහන්සේට කීකරු විය යුතුය. අප පියවරුන්ගේ දෙවියන් වහන්සේ ඔබ විසින් කුරුසියක එල්ලා මරණයට පත් කරන ලද ජේසුස් වහන්සේ උත්ථාන කොට වදාළ සේක. එම තැනැන් වහන්සේ ගැළවුම්කාරයාණන් ද නායකයාණන් ද වන පිණිස දෙවියන් වහන්සේ සිය දකුණතින් දකුණතට උසස් කර වදාළ සේක. එසේ කළේ ඉශ්රායෙල්ට මනස්ථාපනයෙන් පව් කමාවත් දෙන පිණිස ය. මේ කරුණුවලට අපි සාක්ෂිකාරයෝ වෙමු. දෙවියන් වහන්සේට කීකරු වන අයට ප්‍රදානය කර ඇති ශුද්ධාත්මයාණන් වහන්සේ ද සමග සාක්ෂිකාරයෙක් වන සේකැ"යි කීහ. ඔව්හු ඒ අසා කෝපයෙන් දිළිහී ඔවුන් මරන්නට අදහස් කළහ.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 34: 1, 8, 16-19

පිළිතුර: සමිඳුනි, අසරණ අප හට සවන් දුන මැනව. ආලේලූයා //

ගීය:

හැම වේලේම හිමිතුමන්ට මම ප්‍රශස්ති ගී ගයමි.
එතුමන්ගේ ගුණවැණුම් මා මුවෙන් තොර නොවෙයි.
හිමිතුමන් ගුණවත් බව ඔබ ම අත්දැකීමෙන් දැනගන්න.
එතුමන් කෙරේ විශ්වාසය තබන තැනැත්තේ ආසිරි ලබයි.

පව්කම් කරන අය පොළොවෙන් අමතක වී යන ලෙස හිමිතුමාණෝ ඔවුන්ට විරෝධය දක්වන සේක.
දැහැමි අය අයැදුම් කළහ. හිමිතුමාණෝ සවන් දී සියලු දුක් වේදනාවෙන් ඔවුන් මිදූ සේක.

හිමිතුමාණෝ බිඳුණු සිත් ඇත්තන්ට ළං ව සිටින සේක. තැලුණු හදවත් ඇත්තන්ට පිහිට වන සේක.
දැමිටුවන්ට බොහෝ ආපදා ඇතත් හිමිතුමාණෝ ඒ සියල්ලෙන් ඔවුන් මුදා හරින සේක.

# සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
"ඔබ මා දුටු බැවින් අදහා ගත්තෙහිය.
නුදුටු නමුත් අදහන්නෝ භාග්‍යවන්තයෝ ය"යි ස්වාමින් වහන්සේ වදාරණ සේක.
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 3 : 31 –36

**පියාණන් වහන්සේ පුත්‍රයාණන්ට ප්‍රේම කර සියල්ල එතුමන් අතට පැවරූ සේක.**

ඉහළින් වඩිනා තැනැත්තේ සියල්ලන්ට වඩා උතුම් ය. භූමියෙන් වන තැනැත්තේ භූමියට අයිති වේ. ඔහු භෞමික දේ ගැන කතා කරයි. ස්වර්ගයෙන් එන තැනැත් වහන්සේ සියල්ලන්ටම වඩා උතුම් ය. උන් වහන්සේ තමන් ඇසූ දුටු දේ ගැන සාක්ෂි දරණ සේක. එහෙත් කිසිවෙක් උන් වහන්සේගේ සාක්ෂිය නොපිළිගනිති. උන් වහන්සේගේ සාක්ෂිය පිළිගන්නා තැනැත්තේ දෙවියන් වහන්සේ සත්‍යවාදී බව සහතික කරයි. දෙවියන් වහන්සේ එවා වදාළ තැනැත් වහන්සේ දෙවියන් වහන්සේගේ වදන් පවසන සේක. එසේ වන්නේ දෙවියන් වහන්සේ සීමාරහිත ව ශුද්ධාත්මය දානය කරන බැවිනි. පියාණන් වහන්සේ පුත්‍රයාණන්ට ප්‍රේම කරන සේක. සියල්ල උන් වහන්සේ අතට භාර දී ඇත. යමෙක් පුත්‍රයාණන් අදහන්නේ ද ඔහුට සදාතන ජීවනය ඇත. එහෙත් යමෙක් පුත්‍රයාණන් ප්‍රතික්ෂේප කරන්නේ ද ඔහුට ජීවනය නොලැබේ. දේව උදහස ඔහු පිට රඳා පවතියි.

සුවිශේෂ වාක්‍යය එසේය.